20267

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு
**Year End Evaluation** - 2022 (2023 මාර්තු)

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂය / பாடம் / Subject | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 01 |
|---|---|---|---|---|---|---|---|

උපදෙස්:

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරාගන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

■ පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දක්ෂ හා විනීත රියදුරෙකු ලෙස ආයතන කිහිපයක වසර ගණනාවක් සේවය කළ ඉසුරු අකලංක තමාට අයිති ගොඩනැගිල්ලක රියදුරු පුහුණු පාසලක් 'ඉසුරු ලර්නර්ස්' ලෙස ආරම්භ කළේය. සියලුම වර්ගයේ වාහන සඳහා විනීත රියදුරන් බිහිකිරීම ඔහුගේ ප්‍රධාන අරමුණකි. සාධාරණ අයකිරීම් යටතේ රිය පුහුණුව ලබාදීම නිසා මෙම ව්‍යාපාරය ඉහළ කීර්තිනාමයක් හිමිකරගෙන ඇත.

1. ඉහත සිද්ධියේ ඇතුළත් "ඉසුරු ලර්නර්ස්" ව්‍යාපාරය මගින් සපුරාලන මිනිස් අවශ්‍යතාව කුමක්ද?
   1. ප්‍රවාහනය 2. ආරක්ෂාව 3. අධ්‍යාපනය 4. සෞඛ්‍යය

2. මෙම සිද්ධියේ සඳහන් "ඉසුරු ලර්නර්ස්" ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?
   1. ඒකපුද්ගල ව්‍යාපාර 2. හවුල් ව්‍යාපාර 3. සංස්ථාපිත සමාගම් 4. සමිති සංවිධාන

3. ඉහත සිද්ධියේ සඳහන් "ඉසුරු ලර්නර්ස්" ව්‍යාපාරය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   1. මෙම ව්‍යාපාරයේ අයිතිකරුගේ වගකීම සීමිත ය.
   2. මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
   3. මෙම ව්‍යාපාරය ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයකි.
   4. මෙම ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් හිමිය.

4. මෙම ව්‍යාපාරය සඳහා යොදාගත් ඉසුරුට අයත් ගොඩනැගිල්ල අයත්වන නිෂ්පාදන සාධකය වන්නේ.
   1. භූමිය ය. 2. ශ්‍රමය ය. 3. ප්‍රාග්ධනය ය. 4. ව්‍යවසායකත්වය ය.

5. නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතවල ස්වභාවය අනුව මෙම ව්‍යාපාරය,
   1. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි.
   2. මහා පරිමාණ ව්‍යාපාරයකි.
   3. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයකි.
   4. සේවා සැපයීමේ ව්‍යාපාරයකි.

6. රටක ජාතික ආදායම එරට ජනතාව අතර බෙදී ගොස් ඇති ආකාරය,
   1. උද්ධමනයයි.
   2. රැකියා නියුක්තියයි.
   3. විදේශ විනිමය අනුපාතයයි.
   4. ආදායම් ව්‍යාප්තියයි.

7. දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑමක් <u>නොවන්නේ,</u>
   1. දැඩි තරගකාරීත්වයකට මුහුණ දීමට සිදුවීම ය.
   2. නවීන තාක්ෂණය ලබාගත හැකිවීම ය.
   3. විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම ය.
   4. කාර්යක්ෂම යන්ත්‍ර සූත්‍ර ලබාගත හැකිවීම ය.

8. ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් හඳුනාගත හැකි ව්‍යාපාර අවස්ථාවක් වන්නේ,

1. කළමනාරුවන්ගේ අත්දැකීම් ය.
2. ව්‍යාපාර සඳහා බදු සහන ලබාදීම ය.
3. සුවිශේෂී නිෂ්පාදන ක්‍රම ය.
4. ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම ය.

9. සීමිත සමාගම්වල දැකිය හැකි නමුත් හවුල් ව්‍යාපාර වල දැකිය නොහැකි ලක්ෂණයක් වන්නේ,

1. නෛතික පුද්ගලභාවයක් තිබීම ය.
2. ලියාපදිංචිය අනිවාර්ය නොවීම ය.
3. වගකීම අසීමිත වීම ය.
4. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම ය.

10. යම් වෙළෙඳාමක් තොග වෙළඳාමක් ද, සිල්ලර වෙළඳාමක් ද යන්න තීරණය කරන ප්‍රධාන සාධකය වන්නේ,

1. භාණ්ඩ ප්‍රමාණය ය.
2. ගැණුම්කරුගේ චේතනාව ය.
3. භාණ්ඩවල මිල ය.
4. වට්ටම් ප්‍රමාණය ය.

11. ජංගම ගිණුමක් පවත්වාගෙන යාමේ වාසියකි,

1. සෘජු ප්‍රේෂණ රැස් කිරීම.
2. ගනුදෙනු කිරීමේ පහසුව.
3. ඉදිරිදාතම චෙක්පත් ලිවිය හැකි වීම.
4. ගනුදෙනුව සිදුකළ බවට ලිඛිත සාක්ෂියක් තිබීම.

12. යොදාගන්නා සන්නිවේදන මාධ්‍යය පිළිබඳ යවන්නාට හා ලබන්නාට ඇති දැනුම හා කුසලතා මත පහසුවෙන් යොදා ගත හැකි ක්‍රමයක් ලෙස හඳුන්වන්නේ,

1. සුදුසු බව ය.
2. පැහැදිලි බව ය.
3. සරල බව ය.
4. භාවිත කිරීමේ පහසුව ය.

13. රටක සංවර්ධනයේ සාධනීය ලක්ෂණයක් ලෙස අධිවේගී මාර්ග ඇති කිරීම හඳුනාගත හැකි ය. අධිවේගී මාර්ග, ප්‍රවාහනයේ කුමන මූලිකාංගයට අයත් වේද?

1. මාර්ගය
2. මාධ්‍ය
3. බලය
4. පර්යන්තය

14. මහා පරිමාණ ව්‍යාපාරයක් එහි එක් එක් අංශ සඳහා වර්ෂය ආරම්භයේදීම එම ගිණුම් වර්ෂයට ප්‍රමාණවත් මුදල් වෙන්කිරීමක් සිදුකරයි. මෙය කළමනාකරණයේ කුමන මූලිකාංගයට අයත් වේද?

1. සැලසුම්කරණය
2. සංවිධානකරණය
3. මෙහෙයවීම
4. පාලනය

15. 'ඇසුරුම' යන අයිතමය ඇතුළත්වන අලෙවිකරණ මිශ්‍රයේ නිවැරදි විචල්‍ය වන්නේ,

1. නිෂ්පාදිතය ය.
2. මිල ය.
3. ස්ථානය ය.
4. ප්‍රවර්ධනය ය.

16. සමීර පෙරේරා මහත්මා පෞද්ගලික අංශයේ රැකියාවෙන් පසුගිය දිනක විශ්‍රාම ලැබිය. ඔහුට හිමි වූ රු. 30,00000 ක මුදල ආයෝජනය කිරීමට තීරණය කළ ඔහු පහත සඳහන් ප්‍රතිලාභ අපේක්ෂා කරයි.

* ස්ථාවර ප්‍රතිශතයක් යටතේ පොලී ආදායමක් ලබාගත හැකිවීම.
* ඕනෑම අවස්ථාවකදී මුදල් බවට පත්කළ හැකිවීම.
* ආයෝජනය කළ මුදල ආපසු ලැබීම සම්බන්ධයෙන් පූර්ණ රාජ්‍ය ආරක්ෂාවක් හිමිවීම.

ඉහත ප්‍රතිලාභ ලබාගැනීමට සමීර මහත්මා තෝරාගත යුතු වඩාත් සුදුසු ආයෝජන මාර්ගය වන්නේ,

1. සාමාන්‍ය කොටස් මිලට ගැනීම ය.
2. ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කිරීම ය.
3. දේපළ මිලට ගැනීම ය.
4. භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම ය.

17. පහත සඳහන් ගනුදෙනු අතුරින් වත්කම් හා හිමිකම් පමණක් අඩුවීමට බලපාන ගනුදෙනුව වන්නේ.

1. භාණ්ඩ තොගයක් මිලට ගැනීම රු. 12000
2. රක්ෂණ ගාස්තු ගෙවීම රු. 4000
3. බැංකු ණය ආපසු ගෙවීම රු. 25000
4. ණය හිමියන්ට චෙක්පතකින් ගෙවීම රු. 5000

18. මිහිෂ ගේ ව්‍යාපාරයේ 2022-01-01 දින ගිණුම්කරණ සමීකරණයේ පැවති අගයන් පහත දැක්වේ.

වත්කම් (රු) = හිමිකම් (රු) + වගකීම් (රු)

100000 = 60000 + 40000

2022-01-05 දින බැංකුවේ රු. 20,000 ක් තැන්පත් කිරීම හා භාණ්ඩ තොගයක් රු. 5000 කට මිලට ගැනීමෙන් පසු ගිණුම්කරණ සමීකරණයේ අගය වන්නේ,

| වත්කම් (රු) | = හිමිකම් (රු) | +වගකීම් (රු) |
|---|---|---|
| 1. 120,000 | = 80,000 | +40,000 |
| 2. 100,000 | = 40,000 | +60,000 |
| 3. 125,000 | = 85,000 | +40,000 |
| 4. 100,000 | = 60,000 | +40,000 |

**පහත තොරතුරු ඇසුරෙන් අංක 19 සිට 21 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

A රු. 80,000 පරිගණකයක් කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා ණයට ගැනීම

B විදුලි ගාස්තු ගෙව්වා රු. 15000

C රු. 8000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු. 9000 කට අත්පිට මුදලට විකිණීම

D බැංකුවෙන් ණයක් ගත්තා රු. 50000

19. ඉහත ගනුදෙනු අතුරෙන් ව්‍යාපාරයේ හිමිකම් වැඩිවීම සඳහා බලපාන ගනුදෙනුව වන්නේ,

1. A ය 2. B ය. 3. C ය. 4. D ය

20. මෙම ගනුදෙනුවලින් පසු ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයෙහි වගකීම්වල අගය වැඩි වන්නේ,

1. රු. 80,000 කිනි. 2. රු. 50,000 කිනි. 3. රු. 130,000 කිනි. 4. රු. 115000 කිනි.

21. A ගනුදෙනුව අදාළ මූලික සටහන් පොතේ වාර්තා කිරීම සඳහා යොදාගන්නා නිවැරදි මූලාශ්‍ර ලේඛනය වන්නේ.

1. ජ'නල වවුචරය ය. 2. ගැනුම් ඉන්වොයිසිය ය.
3. ගෙවීම් වවුචරය ය. 4. විකුණුම් ඉන්වොයිසිය ය.

22. ණයගැතියන්ගෙන් ලැබී බැංකුවේ තැන්පත් කළ රු. 20,000 ක චෙක්පතක් අගරු වීම වාර්තා කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

| | |
|---|---|
| 1. බැංකු ගිණුම හර | රු. 20,000 |
| ණයගැති ගිණුම බැර | රු. 20,000 |
| 2. අගරු වූ චෙක්පත් ගිණුම හර | රු. 20,000 |
| ණයගැති ගිණුම බැර | රු. 20,000 |
| 3. මුදල් ගිණුම හර | රු. 20,000 |
| අගරු චෙක්පත් ගිණුම බැර | රු. 20,000 |
| 4. ණයගැති ගිණුම හර | රු. 20,000 |
| බැංකු ගිණුම බැර | රු. 20,000 |

23. ඉඩදුන් කාලය තුළ ණය හිමියන්ට මුදල් ගෙවීමේ දී ගෙවිය යුතු ණය වටිනාකමින් ණයහිමියන් කරන අඩු කිරීම, හඳුන්වන වට්ටම් විශේෂය වන්නේ,

1. ලද වට්ටම් ය. 2. වෙළෙඳ වට්ටම් ය. 3. දුන් වට්ටම් ය. 4. මුදල් මට්ටම් ය.

24. තමාරාගේ ව්‍යාපාරයේ 2022 මාර්තු 31 දිනට සුළු මුදල් පොතේ විශ්ලේෂණ තීරුවල එකතුව පහත දැක්වේ.

* ලිපි ද්‍රව්‍ය වියදම් රු. 275
* තැපැල් වියදම් රු. 400
* ගමන් වියදම් රු. 425
* විවිධ වියදම් රු. 450

2022 මාර්තු 31 දිනට සුළු මුදල් භාරකරු අතැති මුදල රු. 450 ක් වූයේ නම් 2022 මාර්තු 01 දිනට සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම කීයද?

1. රු. 1550  2. රු. 2000  3. රු. 450  4. රු. 1500

**පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් අංක 25 හා 26 යන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

උපාලිගේ ව්‍යාපාරයේ 2022 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුමේ පැවති ශේෂය රු. 18500 කි. එය බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග සමාන නොවීය. එම වෙනසට හේතු පහත දැක්වේ.

* තැන්පත් කළ නමුත් බැංකුවට බැර නොවූ චෙක්පත්වල අගය රු. 5000 කි
* බැංකුව අයකළ ගාස්තු රු.1000 කි

25. 2022.12.31 දිනට උපාලිගේ ව්‍යාපාරයේ සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය වන්නේ,

1. රු. 19,500  2. රු. 12,500  3. රු. 17,500  4. රු. 13,500

26. 2022.12.31 දිනට මෙම ව්‍යාපාරයේ සංශෝධිත බැංකු ශේෂය පදනම් කරගෙන බැංකු සැසඳුම පිළියෙල කිරීමෙන් පසු ලැබෙන බැංකු ප්‍රකාශනයේ නිවැරදි ශේෂය වන්නේ,

1. රු. 13,500  2. රු. 12,500  3. රු. 17,500  4. රු. 19,500

27. ගැනුම් ජ'නලයේ එකතුව ලෙජර ගිණුම්වල බැරට සටහන් කරන ගිණුම වන්නේ,

1. ගැනුම් ගිණුම ය.  2. ණයගැති ගිණුම ය.  3. මුදල් ගිණුම ය.  4. ණය හිමි ගිණුම ය.

28. ව්‍යාපාරයක අයිතිකරු විසින් වෙළෙඳ භාණ්ඩ තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගෙනයන ලදී. මෙම ගනුදෙනුව වාර්තා කරන මූලික සටහන් පොත වන්නේ,

1. පොදු ජනලය ය.  2. ගැනුම් ජනලය ය.  3. මුදල් පොත ය.  4. විකුණුම් ජ'නලය ය.

29. ව්‍යාපාරයෙන් සේවක වැටුප් ගෙවීම රු. 15,000ක් ගිණුම් තැබීමේ දී, මුදල් පොත නිවැරදිව බැර කර වරිපනම් ගිණුමට රු. 1500 ක් ලෙස හර කර ඇත. මෙම වරද නිවැරදි කිරීමේ ද්විත්ව සටහන වන්නේ,

| | | |
|---|---|---|
| 1. | සේවක වැටුප් ගිණුම හර | රු. 15000 |
| | අවිනිශ්චිත ගිණුම බැර | රු. 15000 |
| 2. | සේවක වැටුප් ගිණුම හර | රු. 15000 |
| | වරිපනම් ගාස්තු ගිණුම බැර | රු. 15000 |
| 3. | සේවක වැටුප් ගිණුම හර | රු. 15000 |
| | වරිපනම් ගාස්තු ගිණුම බැර | රු. 1500 |
| | අවිනිශ්චිත ගිණුම බැර | රු. 13500 |
| 4. | අවිනිශ්චිත ගිණුම හර | රු. 13500 |
| | සේවක වැටුප් ගිණුම හර | රු. 1500 |
| | වරිපනම් ගාස්තු ගිණුම බැර | රු. 15000 |

30. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක ගිණුම් තැබීමේදී සිදුවූ වරදක් නිවැරදි කිරීමට අදාළ ජනල් සටහනකි.

අවිනිශ්චිත ගිණුම හර රු. 5000

ණයගැති ගිණුම බැර රු. 5000

සිදු වී ඇති වරද වනුයේ,

1. රු. 5000 ක ණයගැති ලැබීම්, ණයගැති ගිණුමේ පමණක් සටහන් වීම ය.
2. රු. 15000 ණයගැති ලැබීම්, ණයගැති ගිණුමේ රු. 5000 ක් ලෙස සටහන් වීම ය.
3. රු. 5000 ක ණය ගැති ලැබීම්, ණයගැති ගිණුමේ හර පැත්තේ සටහන් වීම ය.
4. රු. 5000 ක ණයගැති ලැබීම්, මුදල් පොතේ පමණක් සටහන් වීම ය.

31. ලාභ අරමුණුකර නොගත් සංවිධානයක් විසින් පිළියෙල කරන ආදායම් ප්‍රකාශනය සඳහා අදාළ වන ගිණුම්කරණ පදනම වන්නේ,

1. මුදල් පදනමයි.
2. උපචිත පදනමයි.
3. ණය පදනමයි.
4. ගිණුම්කරණ පදනමයි.

32. 'සුව දිවි' ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 200 කි. එක් සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 500 කි. 2022-12-31 දිනෙන් අවසාන වර්ෂය සඳහා සාමාජික මුදල් 80,000 ක් එම වර්ෂය තුළ ලැබී ඇත. ලැබීම් හා ගෙවීම් ගිණුම සහ ආදායම් ප්‍රකාශනය තුළ දැක්විය යුතු සාමාජික මුදල් ප්‍රමාණය පිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ,

1. රු. 100000 හා රු. 80,000 ය.
2. රු. 80,000 හා රු. 20,000 ය.
3. රු. 80,000 හා රු. 80,500 ය.
4. රු. 80000 හා රු. 100000 ය.

**පහත සඳහන් තොරතුරු ඇසුරින් අංක 33 හා 34 යන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

ඇඟළුම් නිෂ්පාදන ආයතනයක 2022 ජනවාරි මාසයේ පහත පිරිවැය තොරතුරු ඔබට සපයයි.

| | |
|---|---|
| සෘජු ද්‍රව්‍ය පිරිවැය | රු. 30000 |
| සෘජු වෙනත් වියදම් | රු. 10000 |
| ප්‍රාථමික පිරිවැය | රු. 60000 |
| මුළු නිෂ්පාදන පිරිවැය | රු. 100000 |

අමතර තොරතුරු

1. නිපද වූ ඒකක සංඛ්‍යාව 1000 කි.
2. පිරිවැය මත ලාභාන්තිකය 20% කි.

33. මෙම ඇගළුම් නිෂ්පාදන ව්‍යාපාරයේ සෘජු ශ්‍රම පිරිවැයෙහි වටිනාකම වන්නේ,

1. රු. 40,000  2. රු. 20,000  3. රු. 30,000  4. රු. 70,000

34. නිපද වූ ඒකක සියල්ල අලෙවි කළේ නම් ඉපැයූ මුළු ලාභය වන්නේ,

1. රු. 10,000  2. රු. 15,000  3. රු. 20,000  4. රු. 40,000

පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක 35 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අසංකගේ ව්‍යාපාරයේ 2022-12-31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ගැනුම් | 200,000 | |
| විකුණුම් | | 350,000 |
| තොගය 2022.01.01 | 10,000 | |
| ප්‍රාග්ධනය | | 400,000 |
| ගෙනැප්මේ කුලී | 2,000 | |
| ණය හිමියෝ | | 25,000 |
| ණය ගැතියෝ | 35,000 | |
| බැංකු අයිරාව | | 15,000 |
| ගෙවල් කුලී වියදම් | 50,000 | |
| පරිපාලන වියදම් | 18,000 | |
| මූල්‍ය වියදම් | 6,000 | |
| ලද වට්ටම් | | 10,000 |
| දුන් වට්ටම් | 8,000 | |
| 10% බැංකු ණය | | 50,000 |
| බැංකු ණය පොලී | 4,000 | |
| යන්ත්‍ර | 500,000 | |
| විදුලි ගාස්තු | 17,000 | |
| | 850,000 | 850,000 |

අතිරේක තොරතුරු

* 2022-12-31 දිනට ඉතිරි තොගය රු. 20,000
* මාසික ගෙවල් කුලිය රු. 5000
* ණය ගැතියන්ගෙන් රු. 2000 ක් බොල් ණය ලෙස කපාහල යුතු ය.

35. මෙම ව්‍යාපාරයේ 2022-12-31 දිනට විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය වන්නේ,

1. රු. 30,000 2. රු. 192000 3. රු. 210,000 4. රු. 212000

36. මෙම ව්‍යාපාරයේ 2022.12.31 දිනට දළ ලාභය වන්නේ,

1. රු. 69000 2. රු. 150,000 3. රු. 158000 4. රු. 192000

37. මෙම ව්‍යාපාරයේ 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලාභ හෝ අලාභ ප්‍රකාශයට ඇතුළත් කරන බැංකු ණය පොලී ප්‍රමාණය වන්නේ,

1. රු. 1000 2. රු. 4000 3. රු. 5000 4. රු. 9000

38. මෙම ව්‍යාපාරයේ 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය වන්නේ,

1. රු. 42,000 2. රු. 50,000 3. රු. 51,000 4. රු. 52,000

39. මෙම ව්‍යාපාරයේ 2022-12-31 දිනට ජංගම වගකීම්වල වටිනාකම වන්නේ,

1. රු. 25,000 2. රු. 40,000 3. රු. 50,000 4. රු. 51,000

40. මෙම ව්‍යාපාරයේ 2022.12.31 දිනට මුළු හිමිකම කොපමණ ද?

1. රු. 400,000 2. රු. 452,000 3. රු. 480,000 4. රු. 510,000

(ලකුණු 1X40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

20268

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு
Year End Evaluation
- 2022 (2023 මාර්තු)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය |
| පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය 02 |

සැලකිය යුතුයි:

පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්ණ දෙකක් ද II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුව ප්‍රදේශයේ පදිංචි ප්‍රසන්න උසස් පෙළ හදාරා අවසන් වීමත් සමග ආහාර සැකසීමේ හෝටල් පාඨමාලාවක් සම්පූර්ණ කළේය. අගනුවර පෞද්ගලික හෝටල් කිහිපයක වසර තුනක් සේවය කළ ඔහු තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරන ලදී. මොරටුව ප්‍රදේශයේ ජන සංඛ්‍යාව විශාල වීමත් ජනතාවගේ ජීවන රටාවේ ඇති වූ වෙනස්කම් ද සැලකිල්ලට ගෙන දිවා සහ රාත්‍රි ආහාර සකස් කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 'රස බත' නමින් 2022.01.01 දින ආරම්භ කරන ලදී. ඉඩකඩ පහසුකම් සහිත තම නිවසේම කොටසක් වෙන්කරගෙන ආහාර සැකසීමේ කාර්යය එදින ආරම්භ කරන ලදී. තමා විසින් ඉතිරි කරගත් රු. 600,000 ක් ප්‍රාග්ධනය ලෙස ආරම්භයේදීම යෙදවූ ප්‍රසන්න රු. 400,000 ක බැංකු ණයක් ද 2022.01.01 දින ලබාගන්නා ලදී. බැංකු ණය සඳහා වාර්ෂික පොලී අනුපාතය 12% කි.

තම නිවසේ සිටම ආහාර අලෙවි කළ ප්‍රසන්න මසකට රු. 20,000 බැගින් සේවකයන් දෙදෙනකු ද 2022.01.01 දින බඳවාගන්නා ලදී. තමා සතු රු. 200,000 ක් වටිනා උපකරණ ද එදිනම ව්‍යාපාරයට යෙදවිය. ඉතා පිරිසිදු හා ප්‍රනීත රසැති ආහාර සාධාරණ මිලට අලෙවි කිරීම නිසා 'රස බත' ව්‍යාපාරය ප්‍රදේශය පුරා ජනප්‍රිය විය.

2022 ජනවාරි මාසයේ මෙම ව්‍යාපාරයේ පහත ගනුදෙනු සිදුවිය.

| | |
|---|---|
| ජංගම ගිණුමක් ආරම්භ කර මුදල් තැන්පත් කළා | රු. 100,000 |
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | රු. 150,000 |
| ආහාර ඇසුරුම් ද්‍රව්‍ය ගැනුම් | රු. 20,000 |
| සේවක වැටුප් ගෙවීම් ජනවාරි | රු. 40,000 |
| ඉන්ධන වියදම් | රු. 10,000 |
| උපචිත විදුලිය (2022-01-31) | රු. 6,000 |

ජනවාරි මස ආහාර අලෙවියෙන් රු. 350,000 ක ආදායමක් උපයා ගත් ප්‍රසන්න අලෙවිය තවදුරටත් වැඩි කර ගැනීමට ජංගම ලොරි රථයක් මගින් පාරිභෝගික නිවෙස් අසලටම ආහාර රැගෙන යාමට 2022-02-01 දින සිට ව්‍යාපාරය පුළුල් කරන ලදී. මෙම ව්‍යාපාරය පුළුල් කිරීමේ දී පහත සඳහන් ගනුදෙනු පෙබරවාරි මාසයේ සිදුවී ඇත.

| | |
|---|---|
| ලොරි රථය මිලදී ගැනුම් (2022/02/1) | රු. 300,000 |
| ලොරි රථය නවීකරණ වියදම් (2022/02/1) | රු. 100,000 |
| (වීදුරු ආවරණ සවිකිරීමේ හා අනෙකුත් ප්‍රාග්ධන වියදම්) | |
| අමුද්‍රව්‍ය ණයට ගැනුම් | රු. 200,000 |
| ඉන්ධන වියදම් | රු. 30,000 |
| අලෙවි සහායක වැටුප් (පෙබ. මස) | රු. 15,000 |
| විදුලි ගාස්තු (පෙබ. මස) | රු. 5,000 |
| අනෙකුත් සේවක වැටුප් | රු. 40,000 |

ලොරි රථය වාර්ෂිකව 12% බැගින් පිරිවැය මත ක්‍ෂය කළ යුතු ය. ව්‍යාපාරයේ උපකරණ ක්‍ෂය නොකෙරෙන බව සලකන්න. පෙබරවාරි මාසය අවසානයේ ආහාර විකුණුම් ආදායම රු. 450,000 විය. මාසය අවසානයේ තොග කිසිවක් ඉතිරි නොවිය. ප්‍රසන්නට රු. 500,000/- දක්වා බැංකු අයිරා පහසුකම් ලබාගැනීමට ද හැකියාව ඇත.

(i) (අ) 'රස බත' ව්‍යාපාරය සපුරාලන මූලික මිනිස් අවශ්‍යතාව කුමක් ද?

(ආ) හිමිකාරිත්වය අනුව 'රස බත' ව්‍යාපාරය අයත්වන්නේ කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකටද?

(ii) (අ) ලොරි රථය මගින් ආහාර අලෙවි කිරීම අයත්වන සිල්ලර වෙළෙඳාමේ ප්‍රභේදය කුමක් ද?

(ආ) ජංගම ගිණුම ආරම්භ කර මුදල් තැන්පත් කිරීමේ ද්විත්ව සටහන අගයන් සහිතව මෙම සිද්ධිය ඇසුරෙන් දක්වන්න.

(iii) (අ) මෙම සිද්ධියේ සඳහන් 'ජනතාවගේ ජීවන රටාව වෙනස් වීම' අයත්වන්නේ ශදූඅත විශ්ලේෂණයේ කිනම් සාධකයටද?

(ආ) මෙම ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසර සාධක දෙකක් ලියන්න.

(iv) (අ) රස බත ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතු වන්නේ කුමන පළාත් සභාවේද? අදාළ බලධාරියා කවුද?

(ආ) ඒකපුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසි දෙකක් ලියන්න.

(v) (අ) 2022-01-01 දිනට රසබත ව්‍යාපාරයේ හිමිකම කොපමණද?

(ආ) 2022.01.31 දිනට මෙම ව්‍යාපාරයේ වගකීම් කොපමණ ද?

(vi) (අ) බැංකු අයිරාවක් යනු කුමක් ද?

(ආ) මෙම ව්‍යාපාරය පවත්වාගත යුතු මූලික සටහන් පොත් දෙකක් නම් කරන්න.

(vii) (අ) 2022/1/31 දිනට ව්‍යාපාරයේ උපචිත විදුලිය සටහන් කරන මූලික සටහන් පොත නම් කරන්න.

(ආ) එක් ආහාර පැකැට්ටුවක විකුණුම් මිල රු. 200/- ක් ලෙස සටහන් කිරීම අලෙවිකරණ මිශ්‍රයේ කුමන විචල්‍යට අයත් වේද?

(viii) මෙම ව්‍යාපාරයේ 2022 ජනවාරි 31 දිනට මුදල් ශේෂය කොපමණ ද?

(ix) රස බත ව්‍යාපාරයේ මාසික රථ ක්‍ෂය ගිණුම්ගත කිරීමට අදාළ ජ'නල සටහන ලියා දක්වන්න.

(x) රසබත ව්‍යාපාරයේ පළමු මාස දෙක තුළ ඉපයූ ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

(ලකුණු 2 x 10 = 20)

## I කොටස
## ව්‍යාපාර අධ්‍යයනය
### (ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)

2. (i) නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතවල ස්වභාවය අනුව ව්‍යාපාර වර්ග කරන ආකාර දෙක දක්වන්න. (ලකුණු 2)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) මිනිස් අවශ්‍යතා පුද්ගලයාගෙන් පුද්ගලයාට විවිධ වේ.

(ආ) මුදල්, නිෂ්පාදන සාධකයක් වන ප්‍රාග්ධනයට අයත් වේ.

(ඉ) ගුණාත්මක නිෂ්පාදිත ලබාගැනීම ගනුදෙනුකරුවන්ගේ අරමුණකි.

(ඊ) පාරිභෝගිකයන් ආරක්‍ෂා කිරීම බාහිර පරිසර සාධකයක් ලෙස දේශපාලන පරිසරයට අයත් වේ.

(ලකුණු 2)

(iii) මොරටුවේ පදිංචි කාංචනා ඉවතලන පොල් කටු භාවිත කර ඉතා අනර්ඝ විසිතුරු භාණ්ඩ නිර්මාණය කර අලෙවි කරයි. නවෝත්පාදන බිහි කිරීම ඇයගේ අපේක්ෂාව වන අතර වර්තමාන ආර්ථික පරිහානිය තුළ අවදානම් වලට ද ව්‍යාපාරික වශයෙන් ඇය මුහුණ දී ඇත.

(අ) කාංචනාගේ මෙම ක්‍රියාවලිය කුමන නිෂ්පාදන සාධකයට අයත් වේද?

(ආ) ඔබ (අ) හි නම් කළ නිෂ්පාදන සාධකය හඳුන්වන්න. (ලකුණු 02)

(iv) (අ) ආර්ථික පරිසර සාධකයක් ලෙස "ආදායම් ව්‍යාප්තිය" යන්න පැහැදිලි කරන්න.

(ආ) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑම් දෙකක් ලියන්න.

(ලකුණු 02)

(මුළු ලකුණු 08)

3. (i) අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන ගැලීම් සටහනක් මගින් වර්ග කර දක්වන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් සංඛ්‍යාව 2-20 විය යුතු බව 2007 අංක 07 සමාගම් පනතෙහි දක්වා ඇත.

(ආ) නෛතික පුද්ගලභාවයක් නොමැති වීම ඒක පුද්ගල ව්‍යාපාරයට වාසියකි.

(ඉ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය රාජ්‍ය සංස්ථාවකි.

(ඊ) ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීමෙන් නීතිමය පුද්ගලභාවයක් එම ව්‍යාපාරයට හිමිවේ.

(ලකුණු 02)

(iii) ඇඹිලිපිටියේ පදිංචි ශාන් තම ප්‍රදේශයේ ගොවීන්ගෙන් කෙසෙල් මිලදී ගෙන කොළඹ නගරයේ වෙළඳසැල් සඳහා ලොරි රථවලින් ප්‍රවාහනය කරයි. ඔහු සිල්ලර වෙළඳාමේ මෙන්ම තොග වෙළඳාමේ ද නිරත වේ.

(අ) මෙම සිද්ධියේ සඳහන් ලොරි රථය අයත්වන ප්‍රවාහන මූලිකාංගය කුමක් ද?

(ආ) සිල්ලර වෙළඳාමේ ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iv) (අ) ජංගම ගිණුමක් යනු කුමක් ද?

(ආ) චෙක්පතක විශේෂ රේඛනය කරන ආකාර දෙකක් රූප සටහන් මගින් පෙන්වන්න.

(ලකුණු 02)

(මුළු ලකුණු 08)

4. (i) රක්ෂණය යනු කුමක් ද? (ලකුණු 02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.


(අ) උපරිම විශ්වාසය යනු රක්ෂකයා සහ රක්ෂිතයා සියලු කරුණු හෙළිදරව් කළ යුතු බවයි.

(ආ) දේපළ රක්ෂණයට හානිපූරණ මූලධර්මය අදාළ නොවේ.

(ඉ) ප්‍රවාහන ගාස්තු සාපේක්ෂව අඩු වීම ජල මාර්ග ප්‍රවාහනයේ වාසියකි.

(ඊ) තනතුරු හා වැඩ බෙදා හැරීම සැලසුම්කරණයයි. (ලකුණු 02)

(iii) (අ) පහත දැක්වෙන්නේ සන්නිවේදන ක්‍රියාවලියට අදාළ රූප සටහනකි. එය සම්පූර්ණ කරන්න. (රූප සටහන ඔබගේ පිළිතුරු පත්‍රයේ සම්පූර්ණ කරන්න.)




(ආ) කළමනාකරණ මූලිකාංගයක් ලෙස මෙහෙයවීම යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02)

(iv) (අ) කොටස් වෙළෙඳපල යනු කුමක් ද?

(ආ) භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීමේ ප්‍රතිලාභ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 08)

## II කොටස

## ගිණුම්කරණය

**(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)**

05. (i) (අ) ගිණුම්කරණය යන්න නිර්වචනය කරන්න.

(ආ) හිමිකම් ගිණුම් සඳහා උදාහරණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ව්‍යාපාරයක සිදු වූ පහත සඳහන් එක් එක් ගනුදෙනුව සඳහා නිවැරදි ද්විත්ව සටහන් වටිනාකම් සහිතව ලියන්න.

(අ) ණයගැතියන්ගෙන් මුදල් ලැබුණා රු. 15000 යි.

(ආ) පිරිවැය රු. 4000 ක් වූ භාණ්ඩ එම මිලටම සම්පත්ට විකිණීම. (ලකුණු 02)

(iii) ඉන්දිකාගේ ව්‍යාපාරයේ 2022 ජනවාරි 01 දිනට පැවති ශේෂයන් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| යන්ත්‍ර | 200,000 |
| තොගය | 100,000 |
| ණය ගැතියෝ | 50,000 |
| මුදල් ශේෂය | 80,000 |
| ණය හිමියෝ | 40,000 |

ජනවාරි මාසය තුළ පහත ගනුදෙනු සිදු විය.

(1) මේනකාගෙන් භාණ්ඩ ණයට ගැනුම් රු. 20,000

(2) බැංකුවෙන් ණයක් ගත්තා රු. 100,000

(3) පිරිවැය රු. 12,000 ක් වූ භාණ්ඩ රු. 15,000 කට ණයට විකුණුම්

(4) ණය හිමියන්ට මුදල් ගෙව්වා රු. 15,000

අවශ්‍ය වන්නේ

(අ) ආරම්භක ශේෂයන් දක්වමින් ඉන්දිකාගේ ව්‍යාපාරයේ ජනවාරි මාසයේ සිදුවූ සියලු ගනුදෙනු පහත සඳහන් ගිණුම්කරණ සමීකරණයට ආදේශ කිරීම.

| ගනුදෙනුව | වත්කම් | | | | හිමිකම් | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|
| | යන්ත්‍ර | තොග | ණයගැති | මුදල් | | බැංකු ණය | ණය හිමියෝ |
| ශේෂය | | | | | | | |
| (1) | | | | | | | |
| (2) | | | | | | | |
| (3) | | | | | | | |
| (4) | | | | | | | |

(ආ) 2022.01.01 දිනට මෙම ව්‍යාපාරයේ හිමිකම කොපමණ ද? (ලකුණු 04)

(iv) අසිත ගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2022 දෙසැම්බර් මාසයේ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක් වේ.

(1) 2022.12.10 ඉන්වොයිස් අංක 215 යටතේ දුමින්ද ගෙන් ණයට ගැනුම්.
1 kg රු. 230 බැගින් සීනි 20 kg යි
1 kg රු. 400 බැගින් පරිප්පු 10 kg යි
අඩු කළ වෙළඳ වට්ටම 5%

(2) 2022.12.20 ඉන්වොයිස් අංක 225 යටතේ සුසන්ත ගෙන් ණයට ගැනුම්
එකක් රු. 300 බැගින් බීම බෝතල් 15 යි
එකක් රු. 600 බැගින් බිස්කට් පැකට් 10 යි
අඩු කළ වෙළඳ වට්ටම 10%

20267

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත ගනුදෙනු ඇසුරෙන් අසිතගේ ව්‍යාපාරයේ 2022 දෙසැම්බර් මාසයේ ගැනුම් ජ'නලය පිළියෙල කිරීම.

(ආ) 2022.12.10 ඉන්වොයිස් අංක 215 ට අදාළ ගැනුම් ඉන්වොයිසය පිළියෙල කිරීම.

(ලකුණු. 04)

(මුළු ලකුණු 12)

6. (i) (අ) පොදු ජ'නලය යනු කුමක් ද?

(ආ) පොදු ජ'නලයේ සටහන් කරන ගනුදෙනු වර්ග දෙකක් ලියන්න. (ලකුණු 2)

(ii) සාලියගේ ව්‍යාපාරයේ 2022 මැයි මාසයේ බැංකු ප්‍රකාශය පහත දැක්වේ.

බැංකු ගිණුම

| දිනය | විස්තරය | ස පි | වටිනාකම | දිනය | විස්තරය | ස පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 5/1 | ශේෂය ඉ/ගෙ | | 50,000 | 5/7 | කවිශ්ක (10) | | 15000 |
| 5/5 | චෙක් තැන්පත් (100) | | 10,000 | 5/9 | ධනුජි (11) | | 5000 |
| 5/30 | චෙක් තැන්පත් (50) | | 20,000 | 5/11 | දිනුක් (12) | | 12000 |
| 5/31 | චෙක් තැන්පත් (25) | | 30,000 | 5/15 | කළණි (13) | | 13000 |
| | | | | 5/31 | ශේෂය ප/ගෙ | | 65000 |
| | | | 110,000 | | | | 110,000 |
| 6/1 | ශේෂය ඉ/ගෙ | | 65000 | | | | |

බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 5/1 | ශේෂය ඉ/ගෙ | | | 50,000 |
| 5/7 | චෙක් තැන්පත් (100) | | 10000 | 60,000 |
| 5/9 | කවිශ්ක (10) | 15000 | | 45,000 |
| 5/11 | ධනුජි (11) | 5000 | | 40,000 |
| 5/15 | බැංකු ගාස්තු | 200 | | 39,800 |
| 5/17 | රක්‍ෂණ ගාස්තු | 9800 | | 30,000 |
| 5/30 | ශලීන් | | 10000 | 40,000 |
| 5/31 | තිනාරා | | 22000 | 62,000 |

අවශ්‍ය වන්නේ,

1. 2022.05.31 දිනට බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.

2 2022.05.31 දිනට බැංකු සැසඳුම් විස්තරය. (ලකුණු 02)

(iii) මේධාවිගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම සමාන නොවිය. එහි වෙනස වූ රු. 7000 ක් අවිනිශ්චිත ගිණුමේ බැරට සටහන් කරන ලදී. වෙනසට හේතු පහත දැක්වේ.

1. ප්‍රභානිට ණයට විකුණුම් රු. 8000 පිළිබඳ කිසිදු සටහනක් පොත්වල වාර්තා කර නැත.
2. සේවක වැටුප් ගෙවීම රු. 3000 ක් මුදල් පොතේ පමණක් සටහන් කර ඇත.
3. මෝටර් රථ අලුත්වැඩියාවට වැය වූ රු. 5000 ක් මෝටර් රථ ගිණුමට හර කර ඇත.
4. කඩ කුලී ආදායම් රු. 10,000 ක් කඩ කුලී ආදායම් ගිණුමේ සටහන් කර නැත.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන්

(ආ) අවිනිශ්චිත ගිණුම (ලකුණු 04)

(iv) වාසනා ප්‍රකාශකයන්ගේ 2022 වර්ෂයේ පොත් මුද්‍රණයට අදාළ තොරතුරු ඔබට සපයා ඇත.

| | රු. |
|---|---|
| කොළ සහ තීන්ත සඳහා | 45,000 |
| යන්ත්‍ර ක්ෂය | 1,000 |
| සුපරීක්ෂක වේතනය | 16,000 |
| නිෂ්පාදන වැටුප් | 13,000 |
| ගම් සහ අනෙකුත් ද්‍රව්‍ය | 5,000 |
| කම්හල් රක්ෂණය | 6,000 |
| මුරකරු වේතන | 4,000 |

අමතර තොරතුරු

* නිපද වූ පොත් සංඛ්‍යාව 100 කි.
* පිරිවැය මත ලාභාන්තිකය 25% කි.
* පොත් කතුවරයාට එක පොතක් වෙනුවෙන් ගෙවූ මුදල රු. 100 කි නිපද වූ පොත් සියල්ල විකුණා ඇත.

අවශ්‍ය වන්නේ,

1. නිෂ්පාදන පිරිවැය ලේඛනය
2. මුළු නිෂ්පාදන පිරිවැය
3. ඒකකයක පිරිවැය
4. ඒකකයක විකුණුම් මිල (ලකුණු 04)

(මුළු ලකුණු 12)

7. i. උපචිත සංකල්පය පැහැදිලි කරන්න (ලකුණු 02)

ii. ජය හඬ ක්‍රීඩා සමාජයේ 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය තුල සිදුවූ ගනුදෙනුවල සාරාංශයක් පහත දැක්වේ.

| | |
|---|---|
| ▪ සාමාජික මුදල් ලැබීම් | 25000 |
| ▪ ක්‍රීඩා තරග වියදම් | 7000 |
| ▪ පරිත්‍යාග ලැබීම් | 30000 |
| ▪ විදුලි ගාස්තු | 2000 |
| ▪ පුහුණුකරුවන්ට ගෙවීම් | 4000 |
| ▪ ටිකට් පත් අලෙවියෙන් | 12000 |
| ▪ මුද්‍රණ වියදම් | 2500 |

අමතර තොරතුරු

*** මෙම ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 100 කි. එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 300 කි.

*** ටිකට්පත් අලෙවියෙන් රු. 3000 ක් ලැබිය යුතු ය.

අවශ්‍ය වන්නේ,

අ. ඉහත තොරතුරු ඇසුරෙන් ජය හඬ ක්‍රීඩා සමාජයේ 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙල කිරීම. (ලකුණු 02)

(iii) අතුල උදයංග ගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | (හර රු.) | බැර (රු.) |
|---|---|---|
| විකුණුම් | | 800000 |
| ගැනුම් | 450,000 | |
| තොගය (2022.01.01) | 200,000 | |
| ණයගැතියෝ | 60,000 | |
| ණයහිමියෝ | | 25,000 |
| ඉඩම් ගොඩනැගිලි (පිරිවැය) | 800,000 | |
| යන්ත්‍ර සූත්‍ර (පිරිවැය) | 500,000 | |
| <u>ක්ෂය වෙන්කිරීම්</u> | | |
| ඉඩම් හා ගොඩනැගිලි | | 160,000 |
| යන්ත්‍ර සූත්‍ර | | 50,000 |
| ලද වට්ටම් | | 9000 |
| දුන්වට්ටම් | 5,000 | |
| දුරකථන ගාස්තු | 4,000 | |
| වැටුප් හා වේතන | 20,000 | |
| බොල් ණය | 7,000 | |
| ගෙන ඒමේ කුලී | 25,000 | |
| බැංකු ගාස්තු | 3,000 | |
| 10% බැංකු ණය | | 100,000 |
| ප්‍රාග්ධනය | | 930,000 |
| | 2,074,000 | 2,074,000 |

අමතර තොරතුරු

- 2022.12.31 දිනට ඉතිරි තොගයේ පිරිවැය රු. 50,000 කි.
- ජංගම නොවන වත්කම් සරල මාර්ග ක්‍රමය යටතේ වාර්ෂිකව 10% බැගින් ක්ෂය කළ යුතු ය.
- උචිත ගොඩනැගිලි කුලී ආදායම් රු. 5000 කි.

අවශ්‍ය වන්නේ,

(අ) 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය. (ලකුණු 04)

(ආ) 2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04)

(මුළු ලකුණු 12)

## පිළිතුරු පත්‍රය
## 11 ශ්‍රේණිය
## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. - 3 | 11. - 1 | 21. - 1 | 31. - 2 |
| 2. - 1 | 12. - 4 | 22. - 4 | 32. - 4 |
| 3. - 2 | 13. - 1 | 23. - 1 | 33. - 2 |
| 4. - 3 | 14. - 2 | 24. - 2 | 34. - 3 |
| 5. - 4 | 15. - 1 | 25. - 3 | 35. - 4 |
| 6. - 4 | 16. - 4 | 26. - 2 | 36. - 3 |
| 7. - 1 | 17. - 2 | 27. - 4 | 37. - 3 |
| 8. - 2 | 18. - 4 | 28. - 1 | 38. - 4 |
| 9. - 1 | 19. - 3 | 29. - 3 | 39. - 4 |
| 10. - 2 | 20. - 3 | 30. - 4 | 40. - 2 |

(ලකුණු 40)

## II පත්‍රය

1. (i) අ. ආහාර
   ආ. පෞද්ගලික අංශය - ඒකපුද්ගල ව්‍යාපාර
   (ii) අ. සංචාරක සුළු පරිමාණ සිල්ලර වෙළෙඳසැල
   ආ. බැංකු ගිණුම හර රු. 100000
   මුදල් ගිණුම බැර රු. 100000
   (iii) අ. අවස්ථා
   ආ. අයිතිකරු
   සේවකයින්
   (iv) අ. බස්නාහිර පළාත් සභාව - ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්
   ආ. නිවැරදි වාසි දෙකකට ලකුණු පිරිනමන්න.
   (v) අ. රු. 800000
   ආ. රු. 410,000
   (vi) අ. ගිණුමේ පවතින ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කළ විට බැංකුව එම චෙක්පත්වලට ගෙවීම් කිරීම නිසා ගිණුම් හිමියා බැංකුවට ණය ගැතිවන අගය බැංකු අයිරාව නම් වේ.
   ආ. මුදල් පොත
   බැංකු ගිණුම
   (vii) අ. පොදු ජ'නලය
   ආ. මිල

(viii)

මුදල් ගිණුම

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 600000 | බැංකු | 100000 |
| බැංකු ණය | 400000 | ගැණුම් | 150000 |
| විකුණුම් | 350000 | ඇසුරුම් | 20,000 |
| | | සේවක වැටුප් | 40,000 |
| | | ඉන්ධන | 10,000 |
| | | 1/31 ශේෂය ප/ගෙ | 1030,000 |
| | 1350,000 | | 1350,000 |
| 2/1 ශේෂය ඉ/ගෙ | 1030,000 | | |

(ix) පොදු ජ'නලය

| දිනය | විස්තරය | ලෙ | හර | බැර |
|---|---|---|---|---|
| | මෝටර් රථ ක්ෂය හර<br>මෝටර් රථ ක්ෂය වෙන් කිරීම (මෝටර් රථයේ වාර්ෂික ක්ෂය වාර්තා කිරීම) | | 4000 | 4000 |

(x) ශුද්ධ ලාභය රු. 272000 (ලකුණු 2x10 = 20)

**I කොටස - ව්‍යාපාර අධ්‍යයනය**

2. (i) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර
සේවා සැපයීමේ ව්‍යාපාර (ලකුණු 02)

(ii) (අ) අසත්‍ය 1/2
(ආ) සත්‍ය 1/2
(ඉ) සත්‍ය 1/2
(ඊ) අසත්‍ය 1/2 (ලකුණු 02)

(iii) අ. ව්‍යවසායකත්වය
ආ. නිෂ්පාදනය සඳහා අවශ්‍ය භූමිය ශ්‍රමය ප්‍රාග්ධනය වැනි නිෂ්පාදන සාධක සංවිධානය කරමින් යම් නිෂ්පාදන ක්‍රියාවලියක් ආරම්භ කර පවත්වාගෙන යාමේ කාර්යය ව්‍යවසායකත්වයයි.
(ලකුණු 02)

(iv) අ. රටක ජාතික ආදායම එරට ජනතාව අතර බෙදීගොස් ඇති ආකාරයයි. (ලකුණු 01)
ආ. 1. දැඩි තරගකාරිත්වයකට මුහුණ දීමට සිදුවීම
2. දේශීය පුහුණු ශ්‍රමය විදෙස් රටවලට ඇදීයාම. (කරුණු දෙකට ලකුණු 02)
(මුළු ලකුණු 2x4 = 08)


3. (i) නිවැරදි ගැලීම් සටහන තිබේනම් ලකුණු දෙන්න. (ලකුණු 02)

(ii) අ. සත්‍ය 1/2
ආ. අසත්‍ය 1/2
ඉ. සත්‍ය 1/2
ඊ. අසත්‍ය 1/2 (ලකුණු 02)

(iii) අ. මාධ්‍ය 01
ආ. නිවැරදි ලක්ෂණ දකක් ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ලකුණු 02)

(iv) අ. චෙක්පත් මගින් ගනුදෙනු කළ හැකි ගිණුම් විශේෂයකි.

ආ.





(ලකුණු 02)
(මුළු ලකුණු 2x4 = 08)

4. (i) අවදානම් ඒකරාශි කර එක් පාර්ශ්වයකට සිදුවන හානිය හෝ පාඩුව සාමුහිකව බෙදා ගැනීම රක්ෂණයයි. (ලකුණු 02)

(ii) (අ) අසත්‍ය 1/2
(ආ) අසත්‍ය 1/2
(ඉ) සත්‍ය 1/2
(ඊ) අසත්‍ය 1/2 (ලකුණු 02)

(iii) අ.




ආ. සැලසුම් කරන ලද ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී ව්‍යාපාරයේ මානව සම්පත් නිසි ලෙස හැසිරවීමේ ක්‍රියවලිය මෙහෙය වීමයි. (ලකුණු 02)

(iv) අ. සමාගමක් කොටස් නිකුත් කිරීමේ දී ආයෝජකයන් විසින් ඒවා මිලට ගැනීමත් එසේ මිලට ගත් කොටස් තමාට අවශ්‍ය වූ විටෙක වෙනත් අයට විකිණීමත් ආශ්‍රිතව නිර්මාණය වූ වෙළෙඳපොල කොටස් වෙළඳපල නම් වේ.

ආ. ස්ථාවර පතිශතයක් යටතේ පොලී ආදයමක් ලබාගත හැකි වීම.
ඕනෑම අවස්ථාවක මුදල් බවට පත් කළ හැකි වීම.

(ලකුණු 02)
(මුළු ලකුණු 08)

## II කොටස - ගිණුම්කරණය

5. (i) අ. ව්‍යාපාරයකට ඇල්මක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීමට වැදගත් වන ආර්ථික තොරතුරු සැපයීමේ ක්‍රියාවලිය ගිණුම්කරණයයි.
ආ. ප්‍රාග්ධන ගිණුම
ගැනිලි ගිණුම
(ලකුණු 02)

(ii) අ. මුදල් පොත හර රු. 15000
ණය ගැතියා බැර රු. 15000
ආ. සම්පත්ගේ ගිණුම හර රු. 4000
විකුණුම් ගිණුම බැර රු. 4000 (ලකුණු 02)

(iii) අ.

| ගනුදෙනුව | වත්කම් | | | | හිමිකම් | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|
| | යන්ත්‍ර | තොග | ණයගැති | මුදල් | | බැංකු ණය | ණය හිමියෝ |
| ශේෂය | 200000 | 100,000 | 50,000 | 80,000 | 390,000 | --- | 40,000 |
| (1) | | +20,000 | | | | | +20,000 |
| (2) | | | | +100000 | | +100000 | |
| (3) | | -12,000 | +15,000 | | +3000 | | |
| (4) | | | | -15000 | | | -15000 |

(ගනුදෙනු හතර නිවැරදිව වාර්තා කර ඇත්නම් ½ x4 = ලකුණු - 02)
(ආරම්භක ශේෂය නිවැරදිව සටහන් කිරීම ලකුණු - 01)

ආ. රු. 390,000 (ලකුණු 01)

(iv) අ.

ගැනුම් ජ'නලය 1/2

| දිනය | ඉ.ගෙ. | සැපයුම්කරු | වටිනාකම | ලෙ.ගි |
|---|---|---|---|---|
| 12/10 | 215 | දුමින්ද 1/2 | 8360 | |
| 12/20 | 225 | සුසන්ත 1/2 | 9450 | |
| 12/31 | | ගැනුම් ගිණුමට හර කළා 1/2 | 17810 | |

(ලකුණු 02)

ආ. නිවැරදිව ගැනුම් ඉන්වොයිය පිළියෙල කර ඇත්නම් ලකුණු දෙන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 12)

6. (i) අ. අනෙකුත් උපයෝගී පොත්වල සටහන් නොවන ගනුදෙනු මුලින්ම සටහන් කරන පොත පොදු ජ'නලයයි.

ආ. * වැරදි නිවැරදි කිරීමේ සටහන්
* ගැලපුම් සටහන් (ලකුණු 02)

(ii)

සංශෝධිත බැංකු ගිණුම

| දිනය | විස්තරය | ස පි | වටිනාකම | දිනය | විස්තරය | ස පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 5/31 | ශේෂය ඉ/ගෙ | 1/2 | 65,000 | | බැංකු ගාස්තු | | 200 |
| | ශලින් | | 10,000 | | රක්ෂණ ගාස්තු | | 9800 |
| | නිහාරා | | 22,000 | 5/31 | ශේෂය ප/ගෙ | 1/2 | 87000 |
| | | | 97000 | | | | 97000 |
| 6/1 | ශේෂය ඉ/ගෙ | | 87000 | | | | |

බැංකු සැසඳුම් ප්‍රකාශය

| | | | |
|---|---|---|---|
| 1/31 | සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය | 1/2 | 87000 |
| | එකතු කළා | | |
| | ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් | | |
| | දිනුක් (12) | 12000 | |
| | කළණි (13) | 13000 | 25000 |
| | | | 112000 |
| | අඩු කළා | | |
| | නිශ්කාශනය නොවූ චෙක් | | |
| | චෙක් (50) | 20,000 | |
| | චෙක් (25) | 30,000 | (50,000) |
| 5/31 | බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය | 1/2 | 62000 |

පොදු ජ'නලය

| දිනය | ම | විස්තරය | ලෙ. ගි | හර | බැර |
|---|---|---|---|---|---|
| 12/31 | | ණය ගැති - ප්‍රභානි හර<br>විකුණුම්<br>(ණයට විකුණුම් වාර්තා නොවීම) නිවැරදි කිරීම | | 8000 | 8000 } ½ |
| | | සේවක වැටුප් හර<br>අවිනිශ්චිත<br>(සේවක වැටුප් ගිණුමේ සටහන් කිරීම නිවැරදි කිරීම) | | 3000 | 3000 } ½ |
| | | මෝටර් රථ අළුත්වැඩියාව<br>මෝටර් රථ<br>(මෝටර් රථ අළුත්වැඩියා වියදම මෝටර් රථ ගිණුමේ සටහන් කිරීම නිවැරදි කිරීම | | 5000 | 5000 } ½ |
| | | අවිනිශ්චිත හර<br>කඩකුලී ආදායම් බැර<br>(කඩ කුලී ආදායම් ආශ්‍රිත ගිණුම් සටහන් නොවීම නිවැරදි කිරීම) | | 10,000 | 10,000 } ½ |

(ද්විත්ව සටහන් සඳහා ලකුණු 2)
(නිවැරදි සංලක්ෂා සඳහා ½)

අවිනිශ්චිත ගිණුම

| | විස්තරය | | | දිනය | විස්තරය | | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| | කඩ කුලී ආදායම් | | 10,000<br>1/2 | 12/31 | ශේෂය ඉ/ගෙ<br>සේවක වැටුප් | | 1/2 7000<br>3000<br>1/2 |
| | | | 10,000 | | | | 10,000 |

(ලකුණු 04)

වාසනා ප්‍රකාශයෝ
2022 වරෂය සඳහා
පිරිවැය ලේඛනය

| | | |
|---|---|---|
| <u>ප්‍රාථමික පිරිවැය</u> | | |
| සෘජු ද්‍රව්‍ය - කොළ තීන්ත | 45000 | |
| සෘජු ශ්‍රමය - නිෂ්පාදන වැටුප් | 13000 | |
| සෘජු වෙනත් - කර්තෘ භාගය | 10,000 | 68000<br>1/2 |
| <u>පොදුකාර්ය පිරිවැය</u> | | |
| වක්‍ර ද්‍රව්‍ය - ගම් හා අනෙකුත් ද්‍රව්‍ය | 5000 | |
| වක්‍ර ශ්‍රමය - සුපරීක්ෂණ වේතන | 16000 | |
| මුරකරු වේතන | 4000 | |
| වක්‍ර වෙනත් - යන්ත්‍ර ක්ෂය | 1000 | |
| කම්හල් ක්ෂය | 6000 | 32000 |
| මුළු පිරිවැය | | ½ 100000 |

(2) රු. 10000 ලකුණු 01
(3) රු. 1000 ලකුණු 01
(4) රු. 1250 ලකුණු 01

(ලකුණු 4)
(මුළු ලකුණු 12)

7. ආදායම් වලට අදාළව මුදලින් ලැබුණු ප්‍රමාණය කුමක් වුවත් වියදම් වලට අදාලව මුදලින් ගෙවූ ප්‍රමාණය කුමක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වන්නේ කාලච්ඡේදයට අදාල ප්‍රමාණය බව උපචිත සංකල්පයයි.

(ලකුණු 02)

ජය හඬ ක්‍රීඩා සමාජයේ
2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලැබීම් හා ගෙවීම් ගිණුම

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | සාමාජික මුදල් | 1/2 -25000 | | ක්‍රීඩා තරග වියදම් | | 7000 |
| | පරිත්‍යාග ලැබීම් | 30,000 | | විදුලි ගාස්තු | | 2000 |
| | ටිකට්පත් අලෙවිනේ | 1/2- 12000 | | පුහුණුකරුවන්ට | | 4000 |
| | | | | මුද්‍රණ වියදම් | | 2500 |
| | | | | ශේෂය ප/ගෙ | | 1/2- 51500 |
| | | 67000 | | | | 67000 |

(ලකුණු 02)

අතුල උදයංගගේ ව්‍යාපාරයේ
2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලාභ හෝ අලාභ ප්‍රකාශනය 1/2

| | | | |
|---|---|---|---|
| විකුණුම් | | | 800000 |
| (-) විකුණුම් පිරිවැය | | | |
| ආරම්භ තොග | | 200000 | |
| ගැනුම් | | 450,000 | |
| ගෙනඒමේ කුලී | | 25000 | |
| (-) අවසාන තොගය | | 675000 | |
| | | 1/2 (50000) | (625000) 1/2 |
| වෙනත් ආදායම් | | | 175000 1/2 |
| ගොඩනැගිලි කුලී ආදායම් | | 5000 | |
| ලද වට්ටම් | | 9000 | 14,000 |
| (-) වියදම් | | | 189000 |
| බෙදාහැරීමේ වියදම් | | | |
| දුන් වට්ටම් | 5000 | | |
| බොල් ණය | 7000 1/2 | 12000 | |
| පරිපාලන වියදම් | | | |
| ඉඩම් ගොඩනැගිලි ක්ෂය | 1/2 80,000 | | |
| යන්ත්‍ර ක්ෂය | 50,000 | | |
| වැටුප් හා වේතන | 20,000 | | |
| දුරකථන ගාස්තු | 4000 | 154,000 | |
| මූල්‍ය වියදම් | | | |
| බැංකු ගාස්තු | 3000 | | |
| ණය පොලී | 10,000 1/2 | 13000 | |
| | | | (179000) |
| ශු. ලාභය ප්‍රා/ගි/මා | | | 1/2 10,000 |

(ලකුණු 04)

අතුල උදයංගගේ ව්‍යාපාරයේ
2022.12.31 දිනට
මූල්‍ය තත්ව ප්‍රකාශනය 1/2

| ජංගම නොවන වත්කම් | පිරිවැය | ස.ක්ෂය | ධාරණ අගය |
|---|---|---|---|
| ඉඩම් ගොඩනැගිලි | 800,000 | 240,000 | 560,000 |
| යන්ත්‍ර සූත්‍ර | 500,000 | 100,000 1/2 | 400,000 |
| | | | 960,000 1/2 |
| ජංගම වත්කම | | | |
| අවසාන තොගය | | 50,000 1/2 | |
| ණය ගැතියෝ | | 60,000 | |
| උපචිත ගොඩනැගිලි කුලී ආදායම් | | 5000 1/2 | 115,000 |
| මුළු වත්කම් | | | 1075000 |
| හිමිකම් හා වගකීම් | | | |
| ප්‍රාග්ධනය | | 930,000 | |
| ශු. ලාභය | | 1/2 10,000 | |
| | | | 940,000 |
| ජංගම නොවන වගකීම් | | | |
| බැංකු ණය | | | |
| | | | 1/2 100000 |
| ජංගම වගකීම් | | | |
| ණය හිමියෝ | | 25000 | |
| උපචිත ණය පොලී | | 10,000 1/2 | |
| | | | 35000 |
| මුළු හිමිකම් හා වගකීම් | | | 1075000 |

(ලකුණු 04)
(මුළුලකුණු 12)